# සේවා වියුක්තිය අවම කිරීම සඳහා ව්‍යවසාය සංවර්ධන පුහුණු පාඨමාලාවන්ගේ දායකත්වය ( කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

*ඒ.එම්.එන්.ජේ අබේකෝන්*[1]
*උපාලි හෙට්ටිආරච්චි*[2]

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

සංක්ෂේපය

සේවා වියුක්ති ප්‍රශ්නය ශ්‍රී ලංකාව තුළ සමාජ, ආර්ථික සහ දේශපාලන ගැටලු රාශියක් බිහිවීමට බලපාන ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රපංචයකි. විශේෂයෙන් ම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල රැකියා අවස්ථා පුළුල් කිරීමේ දුෂ්කරතාව හා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථාවන් සඳහා ඇතිවන නිපුණතා නොගැලපීමේ තත්ත්වය යන හේතූන් නිසා ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටලුව කැපී පෙනෙන ගැටලුවක් වී ඇත. මෙම ගැටලුව අවම කිරීම සඳහා අනුගමනය කරන විවිධ ක්‍රමෝපායන් අතර ව්‍යවසාය සංවර්ධනය කැපී පෙනෙන විෂය ක්ෂේත්‍රයකි. එය සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද සේවා වියුක්තිය අවම කිරීම සඳහා භාවිත කරන වැදගත් උපාය මාර්ගයකි. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන මෙන් ම රාජ්‍ය නොවන සංවිධානද ව්‍යවසාය සංවර්ධනයේ නිරතව සිටී. ඔවුන් විසින් විවිධ මට්ටමේ ව්‍යවසාය සංවර්ධන පුහුණු පාඨමාලා, සහාය සේවාවන් සහ උපදේශන සේවා පවත්වාගෙන යන ලැබේ. ඒ අනව මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කරනුයේ සේවා වියුක්තිය අවම කිරීම සඳහා ව්‍යවසාය සංවර්ධන පුහුණු පාඨමාලාවල දායකත්වය හඳුනාගැනීමයි.

අධ්‍යයන ප්‍රදේශය වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් පුහුණු පාඨමාලාව හදාරා නිම කළ පුද්ගලයින් 60 දෙනෙකුගේ නියදියක් තෝරා ගෙන ඇත. මෙම අධ්‍යයනය ප්‍රාථමික හා ද්විතීක දත්ත මත පදනම් වන අතර ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. මේ සම්බන්ධව ලියවී ඇති පොත්පත්, සඟරා, අන්තර්ජාල තොරතුරු ද්විතීක දත්ත මූලාශ්‍ර ලෙස භාවිතා කරන ලදී. ඒසේම දත්ත විශ්ලේෂණය කිරීමේ දී වගු සටහන්, තීරු සටහන්, වට සටහන්, රේඛීය සටහන් සහ කයි වර්ග පරීක්ෂාව භාවිත කරන ලදී.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලට අනුව පුද්ගලයෙකු ව්‍යවසායකයෙකු ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලබාදීමේ දී පුහුණු පාඨමාලාවලින් වැඩි දායකත්වයක් ලැබී ඇත. ව්‍යවසාය සංවර්ධන පුහුණු පාඨමාලා සඳහා යොමු වීමට අධ්‍යාපන මට්ටම, වයස ආදී සාධක වලින්  බලපෑමක් නොමැත. ව්‍යවසාය සංවර්ධන පුහුණු පාඨමාලාවට සහභාගී වූවන්ගේ ව්‍යවසායන් තුළින්  රැකියා අවස්ථා වර්ධනය වී ඇත. මෙම පුහුණු පාඨමාලා පවත්වන කාලසීමාව දීර්ඝ කළ යුතු බව හා රජයේ දායකත්වය වැඩි කිරීම තුළින් සේවා වියුක්තිය අවම කිරීම සඳහා වැඩි දායකත්වයක් ලබා ගත හැක.

ප්‍රමුඛ පද - සේවා වියුක්තිය, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු පාඨමාලා, රැකියා අවස්ථා, ව්‍යවසායකත්ව සංවර්ධනය

---

1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය

2 මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය